# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2023 (2024)

අ.පො.ස.(උ.පෙළ) විභාගය 2024 ජනවාරි මස 04 දින ආරම්භ කර 2024 ජනවාරි මස 31 වන දින තෙක් පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මම විභාගය සඳහා පෙනී සිටින පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් අදාළ පාසල් ප්‍රධානීන් වෙත ද, පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයට ද තැපැල් මගින් යොමුකර ඇත. පාසල් ප්‍රධානීන් වෙත එවා ඇති පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර ඔවුන් වෙත නොපමාව බෙදා දිය යුතු අතර, කිසිදු හේතුවක් මත ප්‍රමාද නොකළ යුතු බව විදුහල්පතිවරුන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

තැපැල් මගින් ප්‍රවේශ පත්‍ර නොලැබුණු පෞද්ගලික අයදුම්කරුවන්ට **www.doenets.lk** දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියට පිවිස තම ප්‍රවේශ පත්‍රය බාගත කිරීමට අවශ්‍ය පහසුකම් ද සලසා ඇත.

මේ වන විටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු හෝ ප්‍රවේශ පත්‍ර බාගත කරගත නොහැකිවූ පෞද්ගලික අයදුම්කරුවන් වෙතොත් තමා ඉදිරිපත් කළ ඉල්ලුම්පතේ පිටපතක්, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් හෝ විභාග ගාස්තු ගෙවූ බවට තැපැල් ස්ථානාධිපතිගෙන් ලබාගත් සහතික කළ ලිපියක් සමඟ විභාග දෙපාර්තමේන්තුවට පැමිණිය යුතු ය.

විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත ලැබී ඇති ප්‍රවේශ පත්‍රයන්හි විෂයය, මාධ්‍යය හා නාම සංශෝධන සිදු කර ගැනීමට ඇත්නම්,

- **මෙවර ද සියලු ම සංශෝධන මාර්ගගතව සිදු කර ගත යුතු අතර, ඒ සඳහා** http://onlineexams.gov.lk/eic **වෙබ් අඩවිය වෙත පිවිසිය යුතු ය.**
- **එක් අයදුම්කරුවකුට මෙම සංශෝධන සිදු කර ගැනීමට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණි.**
- **විධිමත් පරීක්ෂණයකින් තහවුරු කර ගත් නාම සංශෝධන හා ජාතික හැඳුනුම්පත් අංක සංශෝධන පමණක් දත්ත පද්ධතියෙහි යාවත්කාලීන කරනු ලබන අතර, තහවුරු නොවන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **මෙම විභාගයේ විභාග මධ්‍යස්ථාන මාරු කිරීම් සිදු කරනු නොලැබේ.**
- **සංශෝධන සිදු කිරීම 2023.12.19 මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වේ.**

අයදුම්කරුවන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ මෙම විභාගය සඳහා පිළිගත් හැඳුනුම්පතක් වශයෙන් පිළිගනු ලැබේ.

1. අයදුම්කරුවකු වෙනුවෙන් වෙනත් අයකු විභාගයට පෙනී සිටීම, සටහන් ළඟ තබාගෙන පිළිතුරු සැපයීම, වෙනත් අයදුම්කරුවකුගේ උදව් ලබාගැනීම, උදව් දීම හා විභාග ශාලාවේ හා ඒ අවට නොමනා හැසිරීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
2. මෙම විභාගය සඳහා ගණක යන්ත්‍ර හා මකන දියර පාවිච්චි කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත් විෂය අංක 33, 65, 66, 67 සඳහා පමණක් වැඩසටහන් සම්පාදනය කළ නොහැකි සාමාන්‍ය ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.
3. දැනටත් කිසියම් රජයේ පාසලක ඉගෙනුම ලබන අයකු පෞද්ගලික අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.
4. විභාග ශාලාව තුළට ජංගම දුරකථන, ස්මාට් වොච් හෝ ඉලෙක්ට්‍රොනික උපාංග ගෙන ඒම සන්තකයේ තබා ගැනීම හා භාවිතය සපුරා තහනම් වන අතර, මෙම නියමය කඩ කරන අයට 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත අනුව දඬුවම් පමුණුවනු ලැබේ.


**විමසීම් :** **දුරකථන අංක :** 011 - 2785211, 2786616, 2784208, 2784537,
**විද්‍යුත් ලිපිනය :** gcealexam@gmail.com
**ෆැක්ස් අංකය :** 011 - 2784422
**තැපැල් ලිපිනය :** **විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ.**


**විභාග කාල සීමාව තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරිය**
**දුරකථන අංක : 0112785211, 0112784208, 0112784537, 0112786616**
**ක්ෂණික ඇමතුම් අංකය : 1911**

**එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර**
**විභාග කොමසාරිස් ජනරාල්**

**6/3/AL/2023**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**
**2023.12.12 දින**

isharaiz.com